## 12 ශ්‍රේණිය ගිණුම්කරණය

## නිපුණතා මට්ටම - 1.1 ආයතනයක් කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා ගිණුම්කරණ තොරතුරු වැදගත්වන ආකාරය විග්‍රහ කරයි.

- ගිණුම්කරණය - උනන්දුවක් දක්වන පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා ගිණුම්කරණ ඒකකයට අදාළ ආර්ථික තොරතුරු සැපයීමේ සමස්ත ක්‍රියාවලිය ගිණුම්කරණයයි.

- ගිණුම්කරණයේ අරමුණ- ගිණුම්කරණ ඒකකය පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ ආර්ථික තොරතුරු සන්නිවේදනය කිරීම ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ වේ.

- ගිණුම්කරණ ඒකකය,පුද්ගලයෙක්,රජයක්,ව්‍යාපාර සංවිධානයක්,ව්‍යාපාරයක් හෝ වෙනත් ඕනෑම කටයුත්තක් විය හැකිය.මෙහි දී ආර්ථික තොරතුරු ලෙස හඳුනාගන්නේ මූල්‍යමය තොරතුරුය.

| ඇල්මක් දක්වන පාර්ශ්ව | ඇල්මැති පාර්ශ්වවලට අවශ්‍ය වන තොරතුරු |
|---|---|
| 1.අයිතිකරු/අයිතිකරුවන් | • ආයෝජනයටසරිලන/සතුටුදායක ප්‍රතිලාභයක් ලබා තිබේද?<br>• තව දුරටත් ආයෝජනය කළ යුතුද? |
| 2.කළමනාකරුවන් | • සැලසුම් නිසි පරිදි ක්‍රියාත්මක වන්නේද?<br>• අනාගත වර්ධනය සඳහා ගත යුතු තීරණ/ සැලසුම් මොනවාද? |
| 3.සේවකයෝ | • රැකියාවේ සුරක්ෂිත බවක් තිබේද?<br>• වැටුප් වැඩි කිරීමට ව්‍යාපාරයට හැකියාවක් තිබේද? |
| 4.රාජ්‍ය ආයතන<br>නිදසුන්-දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | • නියමිත පරිදි බදු ගෙවන්නේද?<br>• අවශ්‍ය වාර්තා අදාළ ආයතනවලට සපයන්නේද?<br>• සාධාරණ මිලකට ගුණත්වයෙන් යුතු නිෂ්පාදිත ලබා දෙන්නේද? |
| 5.ගනුදෙනුකරුවන් | • වගකීම් සහතික(ප්‍රතිඥාහාර) ඉටුකිරීමට ව්‍යාපාරයට හොඳ පැවැත්මක් තිබේද? |
| 6.ණය හිමියෝ සහ ණය සපයන ආයතන | • සපයා ඇති ණය ආපසු ලබා ගත හැකිද?<br>• තව දුරටත් ණය සැපයීම සිදු කිරීම සුදුසු ද? |

### අභ්‍යාස

1.මූල්‍ය ගිණුම්කරණය හා කළමනාකරණ ගිණුම්කරණය යන පද පැහැදිලි කරන්න.

2.මූල්‍ය ගිණුම්කරණ ක්‍රියාවලිය හා කළමනාකරණ ගිණුම්කරණ ක්‍රියාවලිය රූප සටහන් මගින් දක්වන්න.

3.මූල්‍ය ගිණුම්කරණය හා කළමනාකරණ ක්‍රියාවලිය අතර වෙනස පැහැදිලි කරන්න.